# මාසික වෙළඳ විවරණිකාව

## ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
## ශ්‍රී ලංකා මහ බැංකුව

2023 ජූලි
05 වෙළුම 07 නිකුතුව

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය




### මාසික ආනයන ක්‍රියාකාරිත්වය




2023 වසරේ ජූලි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,020 දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 12.4කින් පහළ ගියේය.

2023 වසරේ ජූලි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,388ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 7.8කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)




2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායම සහ ආනයන වියදම, පිළිවෙළින්, සියයට 10.3කින් සහ සියයට 15.6කින් පහළ ගියේය.

වෙළඳ ගිණුමේ හිඟය, 2022 වසරේ ජූලි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 122ක හිඟයට සාපේක්ෂව 2023 වසරේ ජූලි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 367ක හිඟයක් වාර්තා කළේය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2023 ජන. - ජූලි )

අපනයන (එ.ජ. ඩොලර් මිලියන) ආනයන (එ.ජ. ඩොලර් මිලියන)



# අපනයන ක්‍රියාකාරිත්වය

## අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - ජූලි)




## අපනයන පරිමා හා මිල දර්ශක - (ජන. - ජූලි)




2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික සහ ඛනිජමය නිෂ්පාදිත අපනයන ඉපැයීම් අඩුවීම හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායම පහළ ගියේය. එසේ වුවත්, කෘෂිකාර්මික අපනයන ආදායමෙහි සුළු ඉහළ යෑමක් වාර්තා විය.

2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන පරිමා දර්ශකය සහ අපනයන මිල දර්ශකය, පිළිවෙළින් සියයට 0.3කින් සහ සියයට 10.1කින් පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන

### කෘෂිකාර්මික අපනයන ආදායම




### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ජූලි)




### තේ සහ රබර් මිල ගණන් *




*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත

2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, ප්‍රධාන වශයෙන් තේ සහ කුළුබඩු අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත, මුහුදු ආහාර සහ ස්වභාවික රබර් අපනයන ආදායමෙහි පහළ යෑමක් වාර්තා කළේය.

## කාර්මික අපනයන

### කාර්මික අපනයන ආදායම




### කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ජූලි)




### නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්




2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී ප්‍රධාන වශයෙන් ඇඟලුම් ඇතුළු බොහෝ කාර්මික අපනයන ආදායම් පුළුල් වශයෙන් පහළ යෑම හේතුවෙන් කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, සත්ත්ව ආහාර සහ මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

### ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. - ජූලි)




### ආනයන පරිමා හා මිල දර්ශකය - (ජන. - ජූලි)




අන්තර් සහ ආයෝජන ඇතුළු ආනයන කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය ද, පිළිවෙළින්, සියයට 5.0 කින් සහ සියයට 11.2කින් පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම




පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - ජූලි)




සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය




ආහාර හා පාන වර්ග යටතේ වර්ග කර ඇති සීනි, පොල් තෙල් සහ එළවළු මෙන්ම ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත යටතට අයත් සහල් මෙන්ම රෙදිපිළි හා උපාංග ආනයන වියදම අඩු වීම 2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී කැපී පෙනුණි.

# අන්තර් භාණ්ඩ ආනයන

අන්තර් භාණ්ඩ ආනයන වියදම




අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - ජූලි)**




**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**




* 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි, ඔක්තෝබර් මාසවල සහ 2023 වසරේ පෙබරවාරි මාසයේ දී බොරතෙල් ආනයනය කර නැත.

මූලික වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ඉන්ධන, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ තිරිඟු, දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග, පොහොර සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන

**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- ජූලි)**




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

[Public]



# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | ජූලි 2022 | ජූලි 2023 | වෙනස (%) | ජන. - ජූලි 2022 | ජන. - ජූලි 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **228.3** | **230.8** | **1.1** | **1,454.3** | **1,460.0** | **0.4** |
| එයින් | තේ | 117.5 | 115.2 | -2.0 | 694.9 | 750.7 | 8.0 |
| | පොල් | 33.1 | 31.2 | -5.7 | 248.9 | 192.2 | -22.8 |
| | කුළුබඩු | 33.8 | 37.2 | 10.1 | 193.4 | 213.2 | 10.3 |
| | මුහුදු ආහාර | 20.6 | 17.2 | -16.5 | 162.8 | 149.6 | -8.1 |
| **කාර්මික අපනයන** | | **933.2** | **785.9** | **-15.8** | **6,201.4** | **5,402.0** | **-12.9** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 551.4 | 428.9 | -22.2 | 3,528.7 | 2,889.5 | -18.1 |
| | රබර් නිෂ්පාදිත | 86.4 | 77.3 | -10.5 | 579.7 | 509.9 | -12.0 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 32.2 | 37.8 | 17.4 | 377.6 | 285.0 | -24.5 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 49.7 | 49.6 | -0.1 | 324.1 | 298.5 | -7.9 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 52.4 | 49.9 | -4.9 | 322.9 | 367.4 | 13.8 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 44.1 | 36.6 | -16.8 | 244.3 | 305.5 | 25.0 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.2 | 6.6 | -19.4 | 45.5 | 40.8 | -10.4 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **3.1** | **3.7** | **20.5** | **31.0** | **29.5** | **-5.0** |
| **මුළු අපනයන** | | **1,164.6** | **1,020.4** | **-12.4** | **7,686.8** | **6,891.5** | **-10.3** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | ජූලි 2022 | ජූලි 2023 | වෙනස (%) | ජන. - ජූලි 2022 | ජන. - ජූලි 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **184.3** | **266.8** | **44.8** | **1,714.4** | **1,760.2** | **2.7** |
| **ආහාර හා පාන වර්ග** | | 109.7 | 160.3 | 46.2 | 966.6 | 1,005.8 | 4.1 |
| එයින් | එළවළු (ආ) | 24.2 | 38.1 | 57.4 | 193.3 | 211.1 | 9.2 |
| | සහල් | 24.8 | 1.0 | -95.8 | 195.6 | 11.1 | -94.3 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 74.6 | 106.4 | 42.7 | 747.9 | 754.4 | 0.9 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 33.9 | 49.3 | 45.5 | 301.0 | 413.8 | 37.5 |
| **අන්තර් භාණ්ඩ** | | **889.0** | **882.0** | **-0.8** | **7,547.5** | **6,328.4** | **-16.2** |
| එයින් | ඉන්ධන | 345.4 | 381.0 | 10.3 | 2,929.3 | 2,735.9 | -6.6 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 220.3 | 197.6 | -10.3 | 1,905.9 | 1,391.6 | -27.0 |
| | පොහොර | 32.3 | 23.3 | -27.7 | 78.3 | 110.2 | 40.8 |
| | තිරිඟු හා ඉරිඟු | 4.1 | 10.8 | 166.1 | 140.4 | 198.8 | 41.6 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **213.5** | **238.8** | **11.9** | **2,053.1** | **1,459.4** | **-28.9** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 145.0 | 167.0 | 15.2 | 1,326.3 | 989.5 | -25.4 |
| **මුළු ආනයන** | | **1,286.8** | **1,387.6** | **7.8** | **11,315.0** | **9,548.1** | **-15.6** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | ජූලි 2022 | ජූලි 2023 | වෙනස (%) | ජන. - ජූලි 2022 | ජන. - ජූලි 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -122.2 | -367.1 | | -3,628.2 | -2,656.6 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | ජූලි 2022 | ජූලි 2023 | වෙනස (%) | ජන. - ජූලි 2022 | ජන. - ජූලි 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | |
| වටිනාකම් දර්ශකය | 162.1 | 142.0 | -12.4 | 152.8 | 137.0 | -10.3 |
| පරිමා දර්ශකය | 149.0 | 164.3 | 10.3 | 163.2 | 162.7 | -0.3 |
| මිල දර්ශකය | 108.8 | 86.5 | -20.5 | 93.6 | 84.2 | -10.1 |
| **ආනයන** | | | | | | |
| වටිනාකම් දර්ශකය | 115.2 | 124.2 | 7.8 | 144.7 | 122.1 | -15.6 |
| පරිමා දර්ශකය | 97.3 | 131.4 | 35.1 | 133.6 | 127.0 | -5.0 |
| මිල දර්ශකය | 118.4 | 94.5 | -20.2 | 108.3 | 96.1 | -11.2 |
| **වෙළඳ මිල අනුපාතය** | 91.9 | 91.5 | -0.4 | 86.5 | 87.6 | 1.3 |

(අ) තාවකාලික
(ආ) පරිප්පු, ඵෑණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද